"ජලය මානව හිමිකමකි - සුවරැකුම අභිමානයකි"

# ජල සම්පාදන අමාත්‍යාංශය

## ලෝක බැංකු සහයෝගිතා ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP)

### ණය අරමුදල් අංක - Cr.5685 - LK

## ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම සඳහා ඇබෑර්තු

ලෝක බැංකු සහයෝගිතා ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) සැලසුම් කොට ඇත්තේ නල ජල පහසුකම් සේවා ප්‍රවේශයන් වර්ධනය කිරීමටත්, මුලතිව්, කිලිනොච්චි, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක වල සනීපාරක්ෂක තත්ත්වයන් වැඩිදියුණු කිරීමත් හා පානීය ජල අංශයේ ආයතනවල ධාරිතා සංවර්ධන කටයුතුත් සඳහා වේ.
ජල සම්පාදන යෝජනාක්‍රම හා සනීපාරක්ෂක ව්‍යාපෘති ඉදිකිරීම් දැනටමත් ආරම්භ කොට ඇත. අදාළ ව්‍යාපෘතිය සඳහා දැනටමත් වසර 05 ක් ගතවී ඇති අතර, අදාළ කාර්යයන්ගෙන් 77% ප්‍රමාණයක් සම්පූර්ණ කොට ඇත.

මෙම ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) කොළඹ පිහිටුවා ඇති අතර, එක් එක් දිස්ත්‍රික්කයකට එක බැගින් දිස්ත්‍රික් සහායක ඒකක (DSUS) ස්ථාපිත කොට ඇත. සමස්ත ව්‍යාපෘති පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 183 කි.

ඒ අනුව, පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා, ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන්, පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය.

**ප්‍රජා සංවර්ධන සහකාර තනතුර**

**(MN 4 ශ්‍රේණිය III)**

**රැකියා ස්ථානය**

**PMU - කොළඹ.**

**දිස්ත්‍රික් සහායක ඒකකය - සියලු දිස්ත්‍රික්ක**

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකා ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD) වෙතින් ලබාගත් පූර්ණ කාලීන ඩිප්ලෝමාවක්.

ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිවල සේවය කොට ඇති අයවළුන්හට ප්‍රමුඛතාව හිමිවේ.

**කනිෂ්ඨ තාක්ෂණ නිලධාරී (MN 2 ශ්‍රේණිය III)**

**රැකියා ස්ථානය**

**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, කොළඹ.**

**දිස්ත්‍රික් සහායක ඒකක**

**සුදුසුකම්**

ජාතික තාක්ෂණ සහතිකය (සිවිල් / යාන්ත්‍රික / විදුලිමය) හෝ ඉහළ සුදුසුකම් ලබා තිබීම,

හෝ

තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ NVQ සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම,

හෝ

**වෙනත් අදාළ සුදුසුකම්**

ජල සම්පාදන ව්‍යාපෘතිවල ඉදිකිරීම් සුපරීක්ෂණ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල පළපුරුද්ද සහිත අයදුම්කරුවන්හට ප්‍රමුඛතාව හිමිවේ.

**ඉහත සඳහන් තනතුරු සඳහා පොදු කොන්දේසි :**

**වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 64 කට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :**

වැටුප් 2019/01 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මත පදනම් වේ.

**සේවා කොන්දේසි හා නියමයන් :**

බඳවා ගැනීම්, මූලිකව, කොන්ත්‍රාත් පදනමින්, වසර එකකට සිදුකරනු ලබන අතර, සතුටුදායක කාර්යසාධන අගැයුම් මත වාර්ෂිකව අලුත්කළ හැක. අංක 2019/01 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි සඳහන් සියලුම කොන්දේසි ඉහත පත්කිරීම් සඳහා අදාළ වේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද සහිත අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කොට සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වනු ලබන හැකියාවන් මත තෝරා ගැනීම සිදු කෙරේ.

සියලුම ජීවදත්ත, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්වලට, පළපුරුද්දට හා කලින් නිරතවූ සේවාවලට අදාළ සහතිකවල පිටපත් සමග වූ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත, 2020 සැප්තැම්බර් 18 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ "අයදුම්කරනු ලබන තනතුර" සඳහන් කළ යුතුය. රාජ්‍ය / සංස්ථා අංශ සංවිධානවල අයදුම්කරුවන්ගේ අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානි මාර්ගයෙන් යොමු කළ යුතුවේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**අංක 230, ඊ ඩබ්ලිව්. පෙරේරා මාවත,**
**ජුබිලි කණුව, නුගේගොඩ.**

Source: Dinamina, Daily News (2020.08.28)